Department of
Humanities, Rajarata
University of Sri Lanka

The Journal of Studies in Humanities

Volume 5 (II) 2019

# වේගිරිය නාථ දේවාලය සහ රජමහා විහාරය තුළින් පිළිබිඹුවන ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කලා ශිල්ප

එන්.පී.අයි.එම්. වික්‍රමසිංහ
මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ
Email: ireshawickramasinghe123@gmail.com

## Abstract

Local traditional arts and crafts have made a prominent contribution to the nurturing of Sri Lankan culture, and from the Anuradhapura era to the present day, the unique features of these arts and crafts have attracted international attention. Those traditional arts have developed from era to era with unique characteristics, and many of their factors have also been linked to historical places created in different eras. The archeological site including Vegiriya Natha Temple and Rajamaha Vihara is recognized as a collection of traditional arts. This research is centered around the problem of the traditional arts and crafts revealed in that site. Accordingly, this research aims to identify the traditional arts associated with it and identify their identity, utility, and current status. Interviews were also used in this research, which includes the Vegiriya Natha Temple, the Rajamaha Vihara, and the Vaulgala cave system under a fine surface study, studying ancient literary sources and previous research. The cave inscription found in the Vaulgala cave system is written in the pre-Brahmi script of Sri Lanka. Its contents reveal information about people engaged in the gem industry, pottery industry, and ivory carving industry called Manikara, Kumbakara, and Datika. In the study of the house with the Natha Temple and Vihara Mandir, a Buddha statue reflecting the sculptural features of the Kandy period, a pair of Parivara Bhikshu statues, the statues of Lord Avalokiteshwara Natha and Goddess Tara can be studied through contemporary sculptural features. The walls and ceiling of the temple are decorated with paintings of the Kandy period, so contemporary paintings are a good help in identifying the identities and utility of art. The wooden posts used for Vastu construction are carved and decorated like most of the house structures built during the Kandy period, reflecting craftsmanship. In addition to this, the skills of the designers have been highlighted through a stone-carved fountain and stone moon lamps. Many intangible cultural heritages like the annual procession associated with Lord Nath,

the Nanumura festival, and the Kartika festival are also associated with this. When all these arts are taken together, the Anuradhapura period arts such as gem industry, ivory carving, pottery, Kandy period sculptures, paintings, wood, and stone carvings can be seen through the Vegiriya archaeological site, and many intangible cultural heritages are linked around the temple.

**Keywords**: Vegiriya, traditional arts and crafts, Nath temple, Kandy period, Vauvulgala caves

**හැඳින්වීම**

ක්‍රි.පූ.තෙවැනි ශතවර්ෂයේදී සිදු වූ මහින්දාගමනයෙන් අනතුරුව ශ්‍රී ලාංකේය සමාජ, දේශපාලන, ආර්ථික සහ ආගමික ක්ෂේත්‍රයන්හි සිදු වූ පරිවර්තනය මෙරට සංස්කෘතියෙහි ප්‍රධානතම හැරවුම් ලක්ෂ්‍යය විය. බුදු දහමෙන් පෝෂණය වෙමින් භාරතීය ආභාසය ලැබූ ශ්‍රී ලාංකිකයන් විධිමත් දේශපාලනික රටාවකට අනුගත වීමත්, කෘෂි ආර්ථිකය ඔස්සේ ලැබූ සංවර්ධනයත් හේතුවෙන් ස්වයංපෝෂිත ජන සමාජයක් නිර්මාණය විය. මෙහෙයින්ම දියුණු ශිෂ්ටාචාර ලක්ෂණවලට ඇලුම් කළ ශ්‍රී ලාංකිකයන් විවිධ කලා ශිල්ප ප්‍රගුණ කිරීමෙහිලා උත්සුක වී තිබේ. මණිකාර, කුඹකර, පෙහෙකර, දටික, ලපන, තඹකර, කබර (රණවැල්ල 2004:58-293) ආදී වශයෙන් මැණික් කර්මාන්තය, මැටි කර්මාන්තය, පේෂකර්මාන්තය, ඇත්දත් කැටයම් කර්මාන්තය, සිතුවම් කලාව, තඹ කර්මාන්තය සහ යකඩ කර්මාන්තය ආදී විවිධ විචිත්‍ර කලාවන් දේශීය සමාජය තුළ මුල්බැසගෙන තිබේ. පූර්ව බ්‍රාහ්මී සෙල්ලිපි, පුරාවිද්‍යා ස්මාරක සහ පුරාවස්තු මගින් තහවුරු කෙරෙන මෙම කලා ශිල්පයන් හී ආරම්භය වශයෙන් මහාවංශයෙහි දක්වා ඇත්තේ දුමින්දාගමනය යි. ශ්‍රී මහා බෝධි වෘක්ෂයේ දක්ඛිණ ශාඛාව මෙරටට රැගෙන එන අවස්ථාවේ එම බෝධිය පිණිස වූ අනේකවිධ කාර්යයන් ඉටු කිරීම පිණිස ඉන්දියාවේ අශෝක අධිරාජ්‍යයා විසින් ශිල්ප ශ්‍රේණීන් දහ අටකට අයත් ශිල්පීන් මෙරටට එවා ඇති අතර දේශීය කලාවේ මූලාරම්භය ලෙසින් ඓතිහාසික මූලාශ්‍රයන්හි සඳහන්කර ඇත්තේ එම අවස්ථාවයි. (මහාවංශය 2007:19:1-4:81) මෙලෙසින් ආරම්භ වන ශ්‍රී ලාංකේය කලා ශිල්පයන් දේශීය අනන්‍යතාවයන් ගොඩනගා ගනිමින්, නව තාක්ෂණික ක්‍රමෝපායන් භාවිත කරමින් මහනුවර රාජධානි සමය වනවිට දියුණු කලාත්මක ලක්ෂණයන් පිළිබිඹු කරන්නට සමත් වී ඇත.

අනුරාධපුර, පොළොන්නරුව, දඹදෙණිය ආදී වශයෙන් මහනුවර යුගය දක්වා දිවෙන විවිධ කාලපරාසයන් හී පැවති කලා කෘතීන් රාශියක් ස්පර්ශිත සහ අස්පර්ශිත උරුමයන් වශයෙන් ශේෂ වී ඇති අතර ඒවා බොහෝමයක් එම නිර්මාණයන් සිදුකළ එක් කාල පරාසයකට පමණක් සීමා වී ඇත. උදාහරණයක් වශයෙන් අනුරාධපුර පැරණි නගරයෙහි අතිමහත් බහුතරයක් කලා නිර්මාණ අනුරාධපුර අවධියට අයත්වන අතර පොළොන්නරු නටබුන් නගරයේ කලා නිර්මාණයන් මගින් පිළිබිඹු වන්නේ පොළොන්නරු අවධියට අයත් කලා ශිල්පයන් ය. යුග කිහිපයක් ඔස්සේ දිවෙන කලා නිර්මාණ එක් ස්ථානයකට ඒකරාශී වූ

අවස්ථා හමු වනුයේ ඉතාමත් අතලොස්සකි. එම අතලොස්සක් වූ උරුමයන් අතර මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටි වේගිරිය නාථ දේවාලය සහ රජමහා විහාරය ආශ්‍රිත පුරාවිද්‍යාත්මක නටඹුන් සහ පුරාවස්තූන් අනුරාධපුර යුගය සහ ගම්පොල යුගය දක්වාම වූ කලා ශිල්පයන් පිළිබඳ අධ්‍යයනය කළ හැකි පුරාවිද්‍යා ක්ෂේත්‍රයක් වශයෙන් හඳුනාගත හැකි වේ.

**පර්යේෂණ ගැටළුව සහ අරමුණ**

වේගිරිය නාථ දේවාලය සහ රජමහා විහාර පරිශ්‍රයත්, ඒ හා බැඳී ඇති වවුල්ගල ලෙන් පද්ධතියත් ඇසුරු කරගනිමින් සිදු කරන මෙම අධ්‍යයනයේ දී එම පුරාවිද්‍යා ක්ෂේත්‍රය තුළින් හඳුනාගත හැකි අනුරාධපුර සහ ගම්පොළ යුගයන්හී සාධක අනුව පැරණි ශ්‍රී ලංකාවේ පාරම්පරික කලා ශිල්පයන්හී ස්වභාවය කෙබඳු වන්නේ ද යන ගැටළුව කේන්ද්‍රකොට ගනීයි. අධ්‍යයන ක්ෂේත්‍රය තුළින් හමුවන සාධක මත අනුරාධපුර අවධිය හා බැඳී ඇති පාරම්පරික කලා ශිල්පයන් සහ එම ශිල්පයන්හී විකාශය හඳුනාගන්නා අතර ගම්පොල යුගයෙහි නිර්මාණිත දේවාල හා විහාර ගෘහය කේන්ද්‍ර කොටගනිමින් එම යුගයට අයත් කලා ශිල්පයන්ගේ ස්වභාවය සාකච්ඡාවට බඳුන් කරයි. ඊට අමතරව වේගිරියෙහි ඓතිහාසික පසුබිම හඳුනාගැනීම, පාරම්පරික කලා ශිල්පයන්හී පවතින සුවිශේෂී ලක්ෂණ, ඒවායෙහි පැවැත්ම, පාරම්පරික ශිල්පීන් හඳුනාගැනීම මෙන්ම වර්තමාන වේගිරිය අවට ගම්මානයන්හී ජීවමානව පවතින සාම්ප්‍රදායික කලා ශිල්පයන් හඳුනාගැනීම ද උප අරමුණු අතර වේ.

**ක්‍රමවේදය**

මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වේගිරිය බටහිර ග්‍රාමනිලධාරී වසමෙහි පිහිටා ඇති වේගිරිය නාථ දේවාලය, රජමහා විහාරය සහ වවුල්ගල ලෙන් පද්ධතිය ඇසුරු කරගන්නා මෙම පර්යේෂණයේ දී අදාල ස්ථානයන්හී ක්ෂේත්‍ර ගවේෂණයෙහි නිරත වූ අතර එම ස්ථානයට නුදුරින් පවතින බුළුගහතැන්න රජමහා විහාරය, වේගිරිය අම්බලම, ඇම්බැක්කේ දේවාලය සහ අම්බලම, උඩඅළුදෙණිය විහාරය යන පරිශ්‍රයන් ද නිරීක්ෂණය කරන ලදි. මහාවංශය, සිංහල බෝධිවංශය, නම්පොත, තිසර සන්දේශය වැනි සාහිත්‍ය මූලාශ්‍රයන් ද, *Inscriptions of Ceylon Vol-I* සහ *Inscriptions of Ceylon Vol-VIII* ග්‍රන්ථයන් ද අධ්‍යයනට පාදක කරගන්නා ලදි. සිරිමල් රණවැල්ල, අනුරාධ සෙනෙවිරත්න, නන්දසේන මුදියන්සේ, මොරටුවේ සාසනරතන හිමි සහ *John Clifford Holt* ඇතුළු විද්වතුන් ගණනාවකගේ පර්යේෂණ ග්‍රන්ථයන් මූලාශ්‍රකොට ගන්නා ලදි. වේගිරිය පුරාවිද්‍යා පරිශ්‍රයෙහි වර්තමාන පසුබිම සහ ඒ වටා බැඳී ඇති ජන සාහිත්‍යය හඳුනාගනු පිණිස දේවාලයේ කපුරාළවරුන්, බුළුගහතැන්න විහාරයේ ස්වාමීන්වහන්සේලා සහ මෙම ස්ථානයට පැමිණි සැදැහැවතුන් සමගින් සම්මුඛ සාකච්ඡාවන් පවත්වන ලදි. ක්ෂේත්‍ර අධ්‍යයනයෙන්, සාහිත්‍ය මූලාශ්‍රයන්ගෙන් සහ සම්මුඛ සාකච්ඡාවන්ගෙන් රැස්කරගත් සියළු දත්තයන් ඓතිහාසික සංසන්දනාත්මක ක්‍රමවේදය ඔස්සේ විශ්ලේෂණය කරමින් වේගිරිය පරිශ්‍රයෙන් උකහාගත හැකි පාරම්පරික කලා ශිල්පයන් පිළිබඳ විග්‍රහ කරන ලදි.

ISSN (Online): 2961-564X ISSN (Print) : 2362 - 0706

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

හයවැනි පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ දී පැවති ප්‍රධාන විහාර සහ දේවාලයන්හී නාමාවලිය ඇතුලත් නම්පොතෙහි ඇතුළත්කොට ඇති වේගිරිය (නම්පොත 2012:18) වෙත ගම්පොල-වැලිගල්ල මාර්ගයේ කළුවාහල්කඩ හන්දියෙන් ගංහත මාර්ගයේ ගමන් කිරීමෙන් ද, ගෙලිඔය සිට බූවැලිකඩ හරහා ගමන් කිරීමෙන් ද ළඟා විමට හැකි වේ. ඇම්බැක්කේ දේවාලය, බුළුගහතැන්න රජමහා විහාරය, උඩඅළුදෙණිය රජමහා විහාරය, ලංකාතිලකය, ගඩලාදෙණිය ආදී ගම්පොළ යුගයේ ඉදි වූ පුරාවිද්‍යා උරුමයන් ආශ්‍රය කරගනිමින් ස්ථානගත වී තිබේ. වර්ෂ 1965.08.06 දින අංක 14472 දරන ගැසට් අංකය යටතේ පුරාවිද්‍යා ස්මාරකයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති මෙය වරින් වර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් සංරක්ෂණයන්ට බඳුන්කර තිබේ.(මල්සිරි 2013:235) වේගිරිය පරිශ්‍රයෙන් හඳුනාගත හැකි ඉපැරණිම සාධකය වනුයේ වවුල්ගල ලෙන් කටාරයෙහි ඇති පූර්ව බ්‍රාහ්මී අභිලේඛනය යි. ඊට අමතරව ගම්පොළ යුගයේ ඉදි වී යැයි සැළකෙන නාථ දේවාලය, රජමහා විහාරය, පත්තිනි දේවාලය, ගිරි ලිපිය සහ සිංහාසන ගොඩනැගිල්ල අධ්‍යයනයට පාත්‍ර වන ස්මාරකයන් වේ.

අධ්‍යයනයේ පහසුව තකා වේගිරිය පරිශ්‍රයෙහි ඓතිහාසික පසුබිම කෙරෙහි අවධානය යොමු කිරීමේ දී අනුරාධපුර අවධියේ මුල් භාගය දක්වා දිවෙන ඉතිහාසයක් මෙහිලා හඳුනාගත හැකි ය. වේගිරිය දේවාල සහ විහාර පරිශ්‍රය පසුකර දේවාලේ කන්ද යනුවෙන් හැඳින්වෙන කඳු මුදුන තරණය කිරීමෙන් වවුල්ගල ලෙන නමින් හැඳින්වෙන ස්වභාවික ලෙන් පද්ධතියක් වෙත ළඟා විය හැකි වේ. කටාර කොටා ඇති ලෙන් පද්ධතියකින් සකස් වී ඇති මෙය දූල්වල, මොළකොඩ සහ ගෝනවත්ත ආදී ලෙන් හා සමකාලීනව මානව ජනාවාසකරණයේ ප්‍රතිඵලයක් වශයෙන් වාසස්ථාන ලෙස භාවිතකර ඇති අතර මහින්දාගමනයෙන් අනතුරුව භික්ෂූන්ගේ පරිහරණය උදෙසා පූජාකර ඇත. ඒ බවට සාධක වශයෙන් ක්‍රි.පූ.3-2 සියවස් අතර කාලයට අයත්වන පූර්ව බ්‍රාහ්මී අක්ෂරයන්ගෙන් ලියැවුණු ලෙන් ලිපියක් මෙහි හඳුනාගත හැකි වේ. (මල්සිරි 2013:285) වර්ෂ 1898 ලෝරිගේ ගැසටියර් හී වේගිරියේ පිහිටි කෝපි වතුයාය ආශ්‍රිත පර්වතයක් මුදුනෙහි වූ ගල් ගුහාවකින් අශෝක අක්ෂරයන්ගෙන් ලියැවුණු අභිලේඛනයක් හමු වූ බව වාර්තා කර ඇත. ලෝරි විසින් සඳහන් කර ඇත්තේ මෙම ලිපිය පිළිබඳ නෙවිල් විසින් ඔහුට දැනුම් දුන් බවත්, දුරින් හිඳ කියැවූ සෙල්ලිපියෙහි අන්තර්ගතයත් ය. (මල්සිරි 2013:237) පසුව 1970 දී සෙනරත් පරණවිතානයන් විසින් ද සෙල්ලිපිය වෙත ළඟා වීමේ දුෂ්කරතාවය හේතුවෙන් දුරින් හිඳ නිරීක්ෂණය කර තම *Inscriptions of Ceylon Vol-I* කෘතියට මෙම සෙල්ලිපිය ද ඇතුළත්කොට තිබේ. *(Inscriptions of Ceylon Vol-I:62)* වර්ෂ 1962 ජුලි 13 වැනිදා අධික බෑවුම් සහිත ගල් පර්වතය වෙත ළඟා වී සෙල්ලිපියෙහි ස්පර්ශ ලාංඡනයක් ගැනීමට චාල්ස් ගොඩකුඹුරයන් සමත් වූ බව පුරාවිද්‍යා කොමසාරිස්ගේ පාලන වාර්තාවෙහි සඳහන්කර තිබේ. (මල්සිරි 2013:238) පරණවිතානයන් විසින් ප්‍රකාශ කර ඇති පෙළෙහි පරිවර්තනය පහත පරිදි වේ.

1. බත ශුමනශ තිශහ උපශික ශුමනය උපශික තිශලය උපශක --
   කුමරශ ගපති දුටකශ කුබකර සොණහ දටික සුමනශ
2. මණිකර දතෙ පතිකෙ මණිකර චුඩෙ ශපතිකෙ

*(Inscriptions of Ceylon Vol-I:62)*

"හර්තෘ සුමනගේ ද තිස්සගේ ද, උපාසිකා සුමනාගේ ද, උපාසිකා තිස්සලාගේ ද උපාසක --

කුමරාගේ ද, ගෘහපති දුත්තගේ ද, කුම්භකාර සෝණගේ ද, දාධික සුමනගේ ද (ලෙන)

මණිකාර දත්ත කොටස් කරුවෙකි. මණිකාර චූල සහය කොටස් කරුවෙකි"

(මුදියන්සේ 2000:139)

මේ අනුව ස්වාමියා ලෙස සැලකූ තැනැත්තෙකු හා එක්ව ගෘහපති, උපාසිකාවන්, කුඹල් කරුවෙකු, ඇත් දළ කර්මාන්තකරුවෙකු, මැණික් කපන්නෙකු සහ කොටස් හිමියන් එක්ව භික්ෂූණ් උදෙසා මෙම වවුල්ගල ලෙන් පද්ධතිය පූජා කර ඇති බව හඳුනාගත හැකි වේ. මෙම සෙල්ලිපිය තුළින් කඳුකර උස් කඳු බිමක්වන වේගිරිය ජනාවාස වී පැවති බවත්, මලය කඳුකරයට අයත් මෙහි ද අනුරාධපුර මුල් භාගයේ පටන්ම භික්ෂූණ් වාසය කර ඇති බවත් තහවුරු වේ.

වේගිරියෙහි හඳුනාගත හැකි සෙසු පුරාවිද්‍යා අවශේෂයන් සියල්ලම පාහේ ගම්පොල යුගයෙහි නිර්මාණය වී මහනුවර යුගයේ දී වැඩිදියුණු වූ ඒවා ය. අවලෝකිතේශ්වර නාථ ප්‍රතිමා සහිත දේවාලයත්, විහාර මන්දිරයත් නිර්මාණය කර ඇත්තේ ස්වභාවික ගල් ලෙනක් සකස්කර ගොඩනැගිලි අංග එක් කිරීමෙනි. ගල් ගුහාවට සම්බන්ධ කරමින් ඉදිකර ඇති ගොඩනැගිල්ල කොටස් දෙකකට බෙදා දේවාලය සහ විහාරය ලෙසින් භාවිත කරයි. දේවාලය තුළ නාථ සහ තාරා දෙවඟනගේ ප්‍රතිමා තැන්පත්කර ඇතත් පර්යේෂණයේ දී එම දේව ප්‍රතිමා නැරඹීමට අවස්ථාවක් හිමි නොවීය. විහාර ගෘහය තුළ බුද්ධ ප්‍රතිමා සහ සංඝයා වහන්සේලාගේ ප්‍රතිමා, ස්තූපය, උඩරට සම්ප්‍රදායානුකූලව අඳින ලද සිතුවම්, ගල් උළුවස්ස, දැව කැටයම් යෙදූ දැව කුළුණු, සඳකඩපහණ ආදී නිර්මාණ නිරීක්ෂණය කළ හැකි වේ. එම ගොඩනැගිල්ලට පිටතින් කුඩා කුටියක් තුළ පත්තිනි දේවාලය පවත්වාගෙන යයි. මීට අමතරව මෙහි පවත්නා තවත් සුවිශේෂී අංගයක් වන්නේ ගම්පොළ යුගයේ පරාක්‍රමබාහු ඈපාණන් විසින් කරවූ ගිරි ලිපිය යි.

1. ශ්‍රී ශක වර්ෂයෙන් එක්වා දහස් තුන්සිය තිස් ස-
2. -ත් වෙනු ශ්‍රී බුද්ධ වර්ෂයෙන් එක්වා දහස් නවසිය ස-
3. -ත් පනස් වෙනු නවය පුරා දස වසක් වේගිරි දේවාලයේ-
4. -හි ලෝකේශ්වර නාථයන් වහන්සේට බත් පි-
5. -ණිස බුවනෙකබාහු නම් වූ වත් හිමි රජ්ජුරුවානන් ව-
6. -හන්සේට විසි වැන්නේ සා දිසා නාමයෙන් දෙමළ බො-
7. -රාවේ කුඹුර බිජුවත් සත් අමුණ හා එසේම සූ තිස්
8. වැන්නේ පිදූ නාරන්ගම බිජුවට තුන් අමුණ හා වික්‍රම-
9. -බාහු රජ්ජුරුවාණන් වහන්සේට සවන්නේ උ-

10.-න් වහන්සේගේ නාමයෙන් පිදූ කොටකුඹුරේ

11. බිජුවට සත් අමුණ හා බුවනෙකබාහු දස වැ-

12. -න්නේ පරාක්‍රමබාහු ඈපාණන් වහන්සේ විසින් පිදූ

13. කුඹල්වලවේ පොල්වත්තේ කුඹුර බි-

14. -ජුවට සත් අමුණ හා මෙහි බද ගම්- මුදල

*(Inscriptions of Ceylon Vol-VIII:12-13)*

ක්‍රි.ව.1415 වැන්නේ සිට ඉදිරි වර්ෂයක් සඳහා බල පැවැත්වෙන පරිදි ලේඛනගත කොට ඇති මෙම සෙල්ලිපිය මගින් වේගිරිය නාථ දේවාලය උදෙසා සිදු කළ ඉඩම් පූජාවන් පිළිබඳ සඳහන් වේ. බුවනෙකබාහු රජු විසින් දෙමළ බෝරාවේ කුඹුරත්, නාරංගම කුඹුරේ අමුණු තුනකුත්, වික්‍රමබාහු රජු විසින් කොටකුඹුරේ අමුණු හතකුත්, පරාක්‍රමබාහු ඈපාණන් විසින් කුඹල්වලවේ පොල්වත්තේ අමුණු හතකුත් මෙම දේවාලයේ නඩත්තු සහ පුද පූජාවන් සඳහා පවරා දී තිබේ. මෙයින් තහවුරු වන්නේ මෙම දේවාලයේ නඩත්තුව උදෙසා සමකාලීන රජවරුන් සහ නිලධාරීන් විසින් ඉඩම් පූජාකර ඇති බවයි. මේ අනුව අනුරාධපුර යුගයේ පටන් ගම්පොල යුගය දක්වා විහිද යන්නා වූ ඓතිහාසික පසුබිමක් වේගිරිය පුරාවිද්‍යා ක්ෂේත්‍රය වටා බැඳී පවති.

වේගිරිය වටා කේන්ද්‍රගතව ඇති පාරම්පරික කලා ශිල්පයන් පිළිබඳව සිදුකරන මෙම අධ්‍යයනයේ දී ප්‍රථම වශයෙන් අවධානය යොමු කරනු ලබන්නේ වවුල්ගල ලෙනින් හමුවන සෙල්ලිපිය වෙත ය. අනුරාධපුර මුල් භාගයට අයත් වන එම සෙල්ලිපියෙහි පැරණි කලා ශිල්පීන් පිළිබඳ සඳහන් වේ. 'කුබකර සොණහ' යනුවෙන් සෙල්ලිපියෙහි හඳුන්වා ඇත්තේ කුඹල්කාර හෙවත් කුම්බකාර සෝණ නමැත්තාය. (රණවැල්ල 2004:75) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික අවධියේ පටන්ම කාලවර්ණ මැටි බඳුන්, කාලරක්ත මැටි බඳුන් ආදිය පිළිබඳ සාධක හමුවන අතර රංචාමඩමින් හමුවන මැටි බඳුන වර්ණාලේප කර අලංකාර කරන ලද්දකි. සාහිත්‍යමය වශයෙන් ද මහින්දාගමනයේ පටන්ම කුඹල් කරුවන් පිළිබඳ තොරතුරු හමුවේ. ශ්‍රී මහා බෝධිය වැඩම කරන අවස්ථාවේ දී එම කාර්යයට මැදිහත්වන අශෝක රජු විසින් කුඹල් කුලයෙහි තැනැත්තන් ද මෙරටට එවනු ලබන අතර දේවානම්පියතිස්ස රජු විසින් ඔවුනට කුඹල්කරුනා තනතුර ලබා දී ශ්‍රී මහාබෝධිය උදෙසා පුද පූජාවන්වන්ට අවශ්‍ය මැටි වළං ආදිය නිර්මාණය කිරීමෙහි යොදවා තිබේ. (සිංහල බෝධිවංශය 2018:250) සකපෝරුව යොදා ගනිමින් කුඹල් කර්මාන්තයේ නියැළීම ආරම්භ වූ දිනයේ පටන් උසස් තාක්ෂණික ලක්ෂණයන්ගෙන් යුතු වළං, මුට්ටි, හරණී, කළගෙඩි ආදිය නිශ්පාදනය කර ඇති අතර මහනුවර යුගය වනවිට කුඹල් කර්මාන්තය බඩහැල කර්මාන්තය ලෙසින් නාමකරණය වී ඇත. මැටි බඳුන්වලට අමතරව උළු සහ ගඩොල් නිශ්පාදනය ද මෙම කර්මාන්තයේම කොටසක් විය. විශේෂයෙන්ම වර්තමානයේ වේගිරිය ආශ්‍රිත භූමි ප්‍රදේශයෙහි මහවැලි ගංගා ද්‍රෝණියෙන් ලබාගන්නා මැටි පස් භාවිත කරමින් සිදුකරන ගඩොල් කර්මාන්තකරුවන් වාසය කරති. අනුරාධපුර යුගයට අයත් සෙල්ලිපියක් කඳුකරයෙහි ජනාකීර්ණ නොවූ ප්‍රදේශයක ලියා තැබීම තුළින් ඉතා පැරණි මාර්ග පද්ධතියක් හෝ භික්ෂු ආරාම පද්ධතියක්

මේ ආශ්‍රිතව පැවති බවත්, ඒ හා සමීප ජනපදයන්හී කුඹල් කර්මාන්තයේ නියැලෙන්නන් වාසය කර ඇති බවත් මෙමගින් තහවුරු වේ. එසේ නැතහොත් තම නිශ්පාදන අලෙවි කරන්නා වූ කුඹල් කරුවන් මෙම ගල් ලෙන් භූමිය ආශ්‍රිත මාර්ගයක හෝ ගමන් කරන්නට ඇත. මෙසේ වේගිරිය පරිශ්‍රය තුළින් ඓතිහාසික කුඹල් කර්මාන්තයේ ඉපැරණිම යුගයක් පිළිබඳ සාධක පෙන්වා දිය හැකි ය.

පෙර සාකච්ඡා සෙල්ලිපියෙහි දටික සුමන හෙවත් ඇත් දළ ආශ්‍රිත කර්මාන්තයෙහි (රණවැල්ල 2004:125) නිරත වූවෙකු පිළිබඳ සඳහන් වේ. මියගිය දළ ඇතුන්ගේ ඇත් දළ භාවිත කරමින් මාල, වළලු, කඩු මිටි, සෙසත් මිටි ආදිය නිර්මාණය කිරීම ඇත්දළ කර්මාන්තයෙහි බහුලවම දක්නට ඇත. ඇත් දළ කර්මාන්තය පිළිබඳ තොරතුරු හමුවන පැරණිතම සාහිත්‍ය මූලාශ්‍රය වශයෙන් මහාවංශය දැක්විය හැකි අතර එහි සඳහන්ව ඇත්තේ ලෝවාමහාපාය කරවූ දුටුගැමුණු රජු විසින් ඊට දන්තමය විජිනිපතක් පූජා කළ බව ය. (මහාවංශය 2007:27:35:114) තව ද ඇත්දළ කර්මාන්තයෙහි දක්ෂයෙකු වූ ජෙට්ඨතිස්ස රජු විසින් ඇත්දළ ශිල්පය ඉගැන්වීම පිණිස ශිල්පායතන පවා පිහිටුවාගෙන ඇති බව සඳහන් වේ. (මහාවංශය 2007:37:100-102:167) අනුරාධපුර අවධියෙන් පසුව ද අඛණ්ඩව පැවත ආ ඇත් දළ කර්මාන්තය වඩාත් ප්‍රචලිත නොවන්නේ ඊට අවශ්‍ය අමුද්‍රව්‍ය වන ඇත් දළ ලබා ගැනීම පිණිස ඇතෙකු ස්වභාවිකව මිය යෑම තෙක් බලා සිටීම හෝ වනාන්තරයේ ඇත් සොහොන් වෙත ළඟාවීමට සිදු වූ හෙයිනි. පැරණි ශ්‍රී ලාංකිකයෝ ඇතුන් මරා දළ ලබා ගැනීම ප්‍රතික්ෂේප කර ඇති හෙයින් ඇතෙකු ස්වභාවිකව මරණයට පත් වූ පසුව පමණක් දළ ලබාගෙන ඇත. මෙරට ඇත් දත් කර්මාන්තයේ විශිෂ්ඨත්වය පිළිබිඹු වන ප්‍රධාන සාධකයක් වන්නේ මහනුවර යුගයට අයත් කුරුණෑගල රිදීවිහාරයේ ඇත් දළ කැටයම් යොදා ඇති උළුවස්සයි. මීට අමතරව කෞතුකාගාර ආශ්‍රිතව ද ඇත් දළයෙන් නිර්මාණය කළ බුදු පිළිම, ආභරණ, හිස පීරන පනා, විසිතුරු භාණ්ඩ ආදී නිමැවුම් ගණනාවක් හඳුනාගත හැකි වේ. මේ අනුව පූර්ව බ්‍රාහ්මී සෙල්ලිපියෙහි සඳහන් ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ වඩාත් පැරණි වූත්, සියුම් වූත් ඇත් දළ කලා ශිල්පය පිළිබඳ තොරතුරු සනාථ කළ හැකිය.

මහාවංශයට අනුව බුදුන් වහන්සේගේ දෙවැනි ලංකාගමනයෙහි අරමුණ වී ඇත්තේ චූළෝදර මහෝදර නා රජුන් දෙපළ විසින් මැණික් පළඟක් අරභයා ඇතිකරගත් සටනක් වළක්වාගැනීමටයි. (මහාවංශය 2007:1:51-13:4) මැණික් එබ්බවූ රාජාසනයක් මෙයින් අදහස්වන අතර විජය රජු විසින් තමන්ගේ මෙහෙසිය වශයෙන් මධුරාපුර කුමාරිකාවක් ගෙන්වා ගැනීම පිණිස පිටත්කර යැවූ දූත කණ්ඩායම අත මිණිමුතු ද යැවූ බව කියැවේ. (මහාවංශය 2007:7:49:36) පාහියන් භික්ෂුව විසින් අභයගිරියෙහි වූ මැණික් එබ්බවූ පිළිමයක් සහ අනර්ඝ මැණික් තැන්පත්කර තිබූ භික්ෂූණ්ගේ භාණ්ඩාගාරය පිළිබඳ සඳහන් කරමින් මෙරට මැණික් කර්මාන්තය ව්‍යාප්තව පැවති බව තහවුරුකර තිබේ. (ෆාහියන්ගේ දේශාටන වාර්තාව:2017:96-97) උක්ත වේගිරිය සෙල්ලිපියෙහි 'මණිකාර දත්ත' නම් ශිල්පියාගේ දායකත්වය සඳහන්වන අතර මෙම ප්‍රදේශය ආශ්‍රිතව මැණික් ශිල්පීන් සිටි බව එයින් තහවුරු වේ. සබරගමු නිම්නයෙහි මෙන් වටිනා මැණික් වර්ග නොවූව ද වේගිරිය ආශ්‍රිත රතු පසෙහි විවිධ වර්ණයෙන් යුතු වටිනාකමින් අඩු පාෂාණ විශේෂ පවතින අතර මහවැලි ගංගා ද්‍රෝණියට ආසන්න වීම ද ඊට හේතුවකි. මේ අනුව මෙම ප්‍රදේශය ආශ්‍රිතව මැණික්

හෝ වෙනත් පාෂාණ යොදා ගනිමින් විවිධ නිර්මාණයන්හී නියැළුණු ශිල්පීන් වාසය කරන්නට ඇති බව තහවුරු කරගත හැකි ය.

වේගිරිය දේවාලය සහ රජමහා විහාරය වෙත අවධානය යොමු කිරීමේ දී කටාර කෙටූ ගල් ලෙනක් පදනම් කරගනිමින් වරිච්චි බිත්ති බැඳ ගොඩනංවා ඇති ලෙන් විහාර වාස්තු විද්‍යාවේ ලක්ෂණ හඳුනාගත හැකි වේ. දේවාලය සහ විහාරය යන ද්විත්වයම එම ලෙන පදනම් කරගත් එකම ගොඩනැගිල්ලක් ලෙස නිමවා ඇතත් ඒවායෙහි ප්‍රවේශ දොරටු වෙන් වෙන්ව තබමින් කුඩා කාමර දෙකක් ලෙස නිර්මාණය කර තිබේ. පොළොවෙන් අඟල් කිහිපයක් ඉහළට එසවුණු පිලක් මත කරවා ඇති මෙම ගෘහ නිර්මාණයෙහි ඉදිරිපස කොටස වහලකින් ආවරණ කර ඇති අතර දැව කණු යොදා ගනිමින් ඉදිරිපස විවෘත කොටසක් නිර්මාණය කර තිබේ.

වේගිරිය පරිශ්‍රයෙහි ඇති කලා ශිල්පයන් අතරින් කැපී පෙනෙන ශිල්පයක් වන්නේ මූර්ති නිර්මාණකරණයයි. විහාරගෙය තුළ සමාධි බුද්ධ ප්‍රතිමාවක් සහ ඊට දෙපසින් පරිවාර භික්ෂු දෙපළකගේ ප්‍රතිමා නිර්මාණය කර තිබේ. සමාධි ඉරියව්වෙන් පද්මාසනයක් මත වැඩ හිඳින බුද්ධ ප්‍රතිමාවෙහි උස අඩි තුනක් පමණ වේ. ඒකාංශකර පොරවා ඇති චීවරයෙහි රැළි වෙන් වෙන්ව සියුම්ව මතුකර ඇත්තේ ගම්පොළ යුගයේ ප්‍රතිමාවන්හී දක්නට ඇති අනන්‍යතා ලක්ෂණ සිහිගන්වමිනි. පුළුල් දෙතොල්, පුළුල් උරහිස්, අඩ සඳ හැඩැති නලල් තලය ආදිය හේතුවෙන් කිසියම් ගෞරවණීය ස්වභාවයක් කුළු ගැන්වෙන මෙම පිළිමයට සිරස්පතක් සවිකර ඇති අතර පිළිමයට පිටුපසින් විචිත්‍ර කේතු මාලාවකි. සමාධි බුද්ධ ප්‍රතිමාව දෙපසින් පිහිටි පරිවාර භික්ෂූණ් දෙපළගේ පිළිම අභය මුද්‍රාවෙන් යුතුව නිර්මාණය කර ඇත.

මහනුවර යුගය වනවිට අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන් නාථ දෙවියන් ලෙස ප්‍රකට වෙමින් මතු බුදුවන බෝසතුන් ලෙස වන්දනාවට පාත්‍ර වන අතර ඒ පිළිබඳ ජීවමාන සාධක සහිත ස්ථානයක් ලෙස වේගිරිය හඳුනාගත හැකි වේ. වේගිරිය නාථ දේවාලයෙහි නාථ දේව මූර්තියක් සහ තාරා දෙවඟනගේ මූර්තියක් තැන්පත් කර ඇතත් අප පර්යේෂණයේ නියැළුණු අවස්ථාවන්හී දී එම ප්‍රතිමා සමීපව අධ්‍යයනය කරන්නට අවස්ථාවක් නොලැබුණු නමුත් *John Clifford Holt* ගේ *Buddha in the Crown* කෘතියෙහි මේ පිළිබඳ සප්‍රමාණික වාර්තාවක් ඇතුළත් වේ. දේවාලය තුළ මැටියෙන් අඹා හුණු පිරියම් කර ඇති නාථ හෙවත් අවලෝකිතේශ්වර දේව ප්‍රතිමාව තැන්පත්කර ඇති අතර එය උසින් අඩි 3 අඟල් 4ක් පමණ වේ. මහාරාජ ලීලාවෙන් සහ ලලිතාසනයෙන් සමන්විත දේව ප්‍රතිමාවේ දකුණු පාදය දණහිසින් නවා ආසනය මත තබා හිඳින අතර වම් කකුල පොළොවට බර කර ඇත. මෙහි ජටාමකුටයෙහි ඉහළ කොටස ස්තූපයක හැඩයෙන් යුතුව නිර්මාණය කර තිබේ. පුළුල් නළල් තලය, විවෘත වූ නේත්‍රා, ලඹ සවන් ආදිය තුළින් ප්‍රතිමාවට එක්ව ඇත්තේ මහේශාක්‍ය ලීලාවකි. දකුණතින් විතර්ක මුද්‍රාව දක්වන පිළිමයෙහි වමත ආසනය මත තබා සිටින අතර යටිකය ධොතියකින් සරසා තිබේ. උඩුකය නග්නව පවතින මෙහි මාල, වළලු, උපවීතය (පූන නූල) ආදී ආභරණ ද හඳුනාගත හැකිය. ප්‍රතිමාවට ගෞරවනීය බවක් ගෙන ඒම පිණිස එහි ආසනය ද පිටුපසින් හොඳින් මතුකර රශ්මි මාලාවක් විහිද යන ආකාරයට නිර්මාණය කර තිබේ. ( *Holt 1991:87)*

නාථ දේව ප්‍රතිමාව සමගින් තැන්පත් කර ඇති නාථ දෙවියන්ගේ බිරිඳ හෙවත් බිසෝ බණ්ඩාර දේව පිළිමය තරමක් පහත් අසුනක තැන්පත්කර ඇති අතර එය උසින් අඩි 2.5ක් පමණ වේ. වම් පය නවා ආසනය මත තබා හිඳින ආකාරයටත් දකුණු පාදය පොළොව මත තබා හිඳින ආකරයටත් නිරූපිත මෙහි දකුණතින් අභය මුද්‍රාවත්, වමතින් වරද මුද්‍රාවත් හඳුනාගත හැකි ය. නළල් තලයෙන් අඩක් පමණ වසා ගනිමින් ඉහලට එසවී ඇති ජටා මකුටය ස්තූපයක කොත් කැරැල්ලක හැඩය සිහි ගන්වයි. විවෘත දෙඇස, පුන් පයෝධර, සිහින් අත්පා ආදිය හේතුවෙන් කාන්තා ලාලිත්‍යය ඉස්මතුකර දක්වන මෙහි යටිකය වසා ධෝතියක් වැනි සළුවක් ද, උඩුකයට හැට්ටයක් ද ඇඳ සිටින ආකාරය පෙන්වා දී ඇත. නළල් පටිය, මාල, වළලු, මණිමේඛලා දාමය, කුණ්ඩලාභරණ ආදියෙන් සැරසී හිඳින තාරා දෙවඟනගෙන් ද ගෞරවණීය බවක් පිළිබිඹු වේ. ( *Holt 1991:87)*

මෙම සියළු ප්‍රතිමාවන් අධ්‍යයනය කිරීමේ දී ගම්පොල යුගයෙහි සාමාන්‍ය නිර්මාණ මාධ්‍යය වූ මැටි බදාමය යොදා ගනිමින් ප්‍රතිමා නිර්මාණය කර ඇති බව තහවුරු වන අතර දකුණු ඉන්දීය ආභාසය සහිත තරමක් දිගු අත්පා යෙදීම ද පොදුවේ හඳුනාගත හැකි ය. මිනිස් ශරීරයක් නිර්මාණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු පරිමාණය, ලාලිත්‍ය ස්වභාවය, නිවැරදි ශාරීරික ලක්ෂණ හුවා දැක්වීමට කලා කරුවා දක්වා ඇති දක්ෂතාවය අනුව වේගිරිය නාථ දේව ප්‍රතිමාවන්, බුද්ධ ප්‍රතිමාව සහ භික්ෂු ප්‍රතිමාවන් ද ගම්පොල යුගයේ නිර්මාණය කර ඇති බව තහවුරු වන අතර සමකාලීන ශිල්පීන්ගේ ශිල්පීය දක්ෂතාවයන් ද හඳුනාගත හැකි වේ.

මෙම රජමහා විහාර ගෘහයෙහි බිත්ති සහ වියන් තලය මහනුවර යුගයේ කලා ලක්ෂණ පිළිබිඹු කරන සිතුවම්වලින් අලංකාර කර ඇත. එතරම් ඉඩකඩ නොමැති විහාර ගෘහය තුළ බිත්ති තීරු තුනකට බෙදා ඒ මත සමාධි ඉරියව්වෙන් වැඩ සිටින්නා වූ බුදුන් වහන්සේලා සිතුවම්කර ඇත එම සෑම බුදු රුවක් අසලින්ම බුදු හිමිට නමස්කාර කරන ගිහියෙකුගේ රුවක් ඇඳ තිබේ. නිල්, කහ. රතු සහ සුදු වර්ණයන් භාවිත කරමින් නිමවා ඇති මෙම සිතුවම් අතර ඇති රික්තකයන් සම්පූර්ණ කිරීමට නෙළුම් මල් චිත්‍රණය කර තිබේ. වියන් තලයෙහි නෙළුම් මල්, පළා පෙති සහ අලංකාර ලියවැල් මෝස්තර යොදා ඇත. කෙසේ වුව හුණු බදාමයේ පතුරු ගැලවී යෑම හේතුවෙන් මෙම සිතුවම් බොහෝමයක් විනාශ මුඛයට ළඟා වී ඇත. මෙම සියළු සිතුවම් තුළින් ගම්‍යමාන වන්නේ එක් කුඩා විහාර කුටියක් වුව සියුම් සිතුවමින් අලංකාර කිරීමට ගම්පොල යුගයේ ශිල්පියා සමත්ව ඇති ආකාරය යි. මෙම ලෙන් විහාරය තුළ කුඩා ප්‍රමාණයේ ස්තූපයක් ද ගොඩනංවා තිබේ.

වේගිරිය පරිශ්‍රයෙහි දක්නට ඇති තවත් කලා නිර්මාණයක් වන්නේ දැව කැටයම් කලාවයි. ගම්පොල යුගයේ අනන්‍යතාව ප්‍රකට කරමින් පේකඩ සහිත දැව කුළුණු යොදා නිර්මාණය කර ඇති විවෘත කොටසවි. ඇම්බැක්කේ දැව කණුවල මෙන් මේවායෙහි ද කැටයම් පනේල යොදා ඇති අතර ඒවායෙහි විවිධ හැඩයෙන් යුතු මල් කැටයම්කර තිබේ. පේකඩ ද පහතට එල්ලා වැටෙන මල් මෝස්තරයක් මෙන් නිර්මාණය කර ඇති අතර වේගිරිය, ඇම්බැක්ක, ගඩලාදෙණිය, බුවැලිකඩ ආදී ප්‍රදේශයන් හී වර්තමානයේ ද පැතිර පවත්නා සාම්ප්‍රදායික කැටයම් කලාවේ එක් පිළිබිඹුවක් වශයෙන් ද මෙම දැව කුළුණු කැටයම්

පෙන්වාදිය හැකිය. දැවමුවා උළුවස්සක් ද දේවාල ගෘහයේ පිටුපස කොටසට සම්බන්ධව නිරීක්ෂණය කර හැකි අතර එහි ද බොරදම් යොදා සියුම් කැටයම් කපා ඇති ආකාරය හඳුනාගත හැකි වේ.

වේගිරිය පුරාවිද්‍යා පරිශ්‍රයෙහි දක්නට ඇති තවත් එක් වැදගත් කලා ශිල්පයක් වන්නේ ගල් කැටයම් කලාව යි. මෙහි විහාර ගෘහයට එළඹෙන උළුවස්ස කළු ගලින් නිම කරන ලද්දකි. අඩි හයයි අඟල් තුනක් උස උළුවස්ස පළලින් අඩි හතරක් ද ගණකමින් අඟල් නවයක් ද වේ. උළුවහු කඳන් පොළොව හා ගැටෙන ස්ථානයෙහි චතුරස්‍ර යුගලයක සිංහ රූපයක් කැටයම් කර තිබේ. දොරටුව දෙසට හැරී ගෙල හරවා ඉදිරිය බලා හිඳින අයුරින් නිර්මාණය කර ඇති මෙහි සිංහයාගේ කේශර, බාහු, වල්ගය ආදිය සියුම්ව කැටයම්කර තිබේ. උළුවහු කඳන් දෙකෙහිම බොරදම් සහිත ලියවැල් රටාවකි. නමුත් එම කැටයම් පැහැදිලිව හඳුනාගැනීමට අපහසු වන්නේ උළුවස්සෙහි ද හුණු ආලේප කිරීමෙන් කැටයමෙහි සියුම් ස්ථාන සුදු හුණු වලින් ආවරණය වී ඇති හෙයිනි. මීට අමතරව මෙම භූමියෙහි ශෛලමය සඳකඩපහණ් යුගලයක් දක්නට හැකි වේ. දේවාල දොරටුවෙහි ඇති සඳකඩපහණ ගම්පොළ යුගයේ ලක්ෂණ ප්‍රකට කරමින් පූර්ණ නෙළුම් මලක් යොදා ඇත. සඳකඩපහණේ ඉදිරිපසට වන්නට කිඹිසි මුහුණකි. එම කිඹිසි මුහුණට දෙපසින් සොටින් නෙළුම් මලක් ගත් හංස රූප, අශ්ව රූප සහ සිංහ රූප  යොදා ඇති අතර දෙපසින් හිඳින් ඇත් තුන් දෙදෙනෙකු මධ්‍යයේ ඇති නෙළුම් මලට පැන් ඉසින ආකාරයකින් කැටයම්කර තිබේ. විහාර දොරටුවේ ඇති සඳකඩපණෙහි කොටසක් බිඳී ගොස් ඇතත් එහි මධ්‍යයේ ඇති නෙළුම් මල ආරක්ෂා වී ඇත. මෙහි ද ඉදිරිපසට වන්නට කිඹිසි මුහුණක් හෝ මල් පොකුරක හැඩයගත් කැටයමක් යොදා ඇතත් බොහෝ සෙයින් ගෙවී යාම හේතුවෙන් හඳුනාගැනීම අපහසු ය. මේ අනුව උළුවහු, සඳකඩපහණ ආදියෙන් ගම්‍යමාන වන්නේ ගම්පොළ යුගයේ ශිල්පියා දැව කැටයමට මෙන් ගල් කැටයමට ද ශූරයෙකු වූ බවයි. සියුම් මෝස්තර ඉස්මතු කරමින් කලාත්මක නිර්මාණයන් කිරීමට රළු කළු ගලක් යොදාගෙන ඇති ආකාරය පැසසුම් කටයුතු ය.

වේගිරිය නාථ දේවාලය ආශ්‍රිතව වාර්ෂික පෙරහැරක් පවත්වන අතර එහිදී දේවාභරණ තැන්පත් කිරීම උදෙසා දේවාලයට මීටර් 200ක් පමණ දුරින් උස් වේදිකාවක් මත සිංහාසන ගොඩනැගිලක් ඉදිකර තිබේ. කුඩා චතුරස්‍රාකාර මෙම ගොඩනැගිල්ලත් දේවාලයත් අතර ඇති මාර්ගය වීදිය යනුවෙන් හඳුන්වයි. මෙතෙක් සාකච්ඡාවට බඳුන් වූ පාරම්පරික කලා ශිල්පයන්ට අමතරව පවතින අස්පර්ශිත උරුමයන් රාශියක් ද වේගිරිය දේවාලය වටා බැඳී ඇත. මෙම දේවාලයේ වර්තමාන බස්නායක නිලමේ වන අනුර සුදන්ත ඊරියගම මහතා ඇතුළු කපු මහත්වරුන් විසින් දේවාලයේ රාජකාරි කටයුතු අඛණ්ඩව පවත්වාගෙ යන අතර මහනුවර දළදා පෙරහැර අවසන් වූ පසු වාර්ෂික පෙරහැර මංගල්‍යයක් මෙහි ද  උත්සවශ්‍රීයෙන් යුතුව පවත්වනු ලැබේ. ඊට අමතරව පෙබරවාරි මාසයේ දී අලුත් සහල් මංගල්‍යය, බක් මාසයේ නානුමුර මංගල්‍යය සිදුකරන අතර සම්මුඛ සාකච්ඡාවන්හීදි හෙළි වූ තොරතුරුවලට අනුව සෑම සෙනසුරාදා දිනයකම දේවාලයේ මුළුතැන්බෑමේ කාර්යයන් සහ පත්තිනි දේවාලයේ ආවතේව සිදුකරන අතර මෙම පරිශ්‍රයෙහි භික්ෂු වාසයක් නොමැති වුවත් බුළුගහතැන්න රජමහා විහාරාධිපති හිමියන්ගේ උපදෙස් පරිදි දිනපතා විහාර මන්දිරයේ පූජා කාර්යයන් ද දායකයන් විසින් සිදුකරනු ලැබෙයි. මෙහෙයින් සාම්ප්‍රදායික ජන විඥානයෙහි අඛණ්ඩ පැවැත්මක් ද මෙතුලින් හඳුනාගත හැකි වේ.

## නිගමනය

අනුරාධපුර යුගයේ දී භික්ෂු සෙනසුනක් බවට පත්ව ඇති වේගිරිය වවුල්ගල ලෙන් පද්ධතියත්, ගම්පොල යුගයේ දී නිර්මාණය වී ඇති වේගිරිය නාථ දේවාලය සහ රජමහා විහාරයත් ආශ්‍රිත පාරම්පරික කලා ශිල්පයන් අධ්‍යයනය කිරීමේදී මහනුවර ප්‍රදේශයට අනුකූල වූ කලා ශිල්පයන් රාශියක් මේ වටා බැඳී පවතින බව හඳුනාගත හැකි විය. පූර්ව බ්‍රාහ්මී සෙල්ලිපිය පදනම් කරගනිමින් අනුරාධපුර යුගයෙහි මෙම ප්‍රදේශය ආශ්‍රිතව කුඹල් කර්මාන්තය, ඇත්දත් කර්මාන්තය සහ මැණික් කර්මාන්තය පැවතී ඇති බව තහවුරු වූ අතර දේවාලය සහ විහාර ගෘහය අධ්‍යයනය කිරීමේ දී ගම්පොල යුගයේ අනන්‍යතාව සහිත මූර්ති, දැව කැටයම්, ගල් කැටයම් මෙන්ම සිතුවම් කලාව ද හඳුනාගත හැකි විය. ඊට අමතරව වර්තමානය දක්වාම අඛණ්ඩව පැවත එන අස්පර්ශිත සංස්කෘතික උරුමයන් රාශියක් ද මේ වටා බැඳී ඇති බව හඳුනාගත හැකි විය. මේ අනුව වේගිරිය නාථ දේවාලය සහ රජමහා විහාරය සහිත පුරාවිද්‍යා පරිශ්‍රය අනුරාධපුර යුගයේ සහ ගම්පොල යුගයන්හී පැවති පාරම්පරික කලා ශිල්පයන් හැදෑරීමට මහෝපකාරී වන පුරාවිද්‍යා පරිශ්‍රයක් වශයෙන් හඳුනාගත හැකිවේ.


**ඡායාරූප**




වේගිරිය නාථ දේවාලය සහ රජමහා විහාරය



පූර්ව බ්‍රාහ්මී සෙල්ලිපිය




නාථ දේව ප්‍රතිමාව සහ තාරා දෙවඟනගේ ප්‍රතිමාව



විහාර ගෘහයේ බිත්තු සිතුවම්

*ISSN (Online): 2961-564X ISSN (Print) : 2362 - 0706*



දැව කැටයම් සහිත කණු



නාථ දේවාලයේ සඳකඩපහණ

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


මහාවංශය, (2007). සංස්ඃ හික්කඩුවේ සුමංගල හිමි සහ වෙනත්, දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

නම්පොත, (2012). සංස්ඃ බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය හිමි, නුගේගොඩඃ මොඩන් පොත් සමාගම.

සිංහල බෝධිවංශය, (2018). සංස්ඃනෝමන් සිරිපාල, කොළඹඃ ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

ෆාහියන්ගේ දේශාටන වාර්තාව, (2017). අනුඃවිමල් පී බලගල්ලේ, කොළඹඃ ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ

Holt. John Clifford, *Buddha in the Crown Avalokitesvara in the Buddhist Traditions of the Sri Lanka*, (1991). Oxford: Oxford University Press

Paranavithana. S, *Inscription of Ceylon, Vollume* I**,** (1983). Sri Lanka:Department of Archeology.

Rohanadeera. M, *Inscription of Ceylon,Vollume* VIII*,* *(*2008). Sri Lanka:Department Of Archeology.

මල්සිරි. ඉෂංක, ඉසුරුමුණිය හා වෙනත් ලිපි, (2013). එස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

මුදියන්සේ. නන්දසේන, සිංහල ශිලා ලේඛන සංග්‍රහය, (2000). එස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

රණවැල්ල. සිරිමල්, සිංහල සෙල්ලිපි වදන් අකාරාදිය, (2004). පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ.